ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2016/06/21 |

## 2016 මැයි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 අප්‍රේල් මාසයේ දී වාර්තා කළ සියයට 4.3 හි සිට 2016 මැයි මාසයේ දී සියයට 5.3 දක්වා ඉහළ ගියේය. ලක්ෂ්‍යමය උද්ධමනය ඉහළ යාම කෙරෙහි නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන උප කාණ්ඩය හැරුණු විට, අනෙකුත් ආහාර නොවන කාණ්ඩ මෙන්ම ආහාර කාණ්ඩය ද දායක විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2016 අප්‍රේල් මස වාර්තා වූ සියයට 2.6 හි සිට 2016 මැයි මස දී සියයට 2.7 දක්වා ඉහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සැලකූ විට 2016 අප්‍රේල් මාසයේ සිට 2016 මැයි මාසය දක්වා සියයට 1.9 ක වැඩිවීමක් වාර්තා වේ. මෙම වැඩිවීම සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. රෙදිපිළි හා පාවහන්; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; ආපනශාලා හා හෝටල් සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩවල මිල ගණන් මැයි මාසය තුළ දී ඉහළ ගියේය. මෑතකාලීන බදු සංශෝධනයන්හි සෘජු බලපෑම ද ජා.පා.මි. දර්ශකයෙහි මෙම මාසික ඉහළ යාම තුළ නිරීක්ෂණය විය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග; අයත් කාණ්ඩයෙහි මිල ගණන් ද 2016 මැයි මාසය තුළ දී ඉහළ ගියේය. එළවළු, සහල්, දෙහි, අර්තාපල්, පරිප්පු, රතුළූණු, අමුමිරිස්, සීනි සහ කරවල මිල ගණන් මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර මධ්‍යසාර පාන හා දුම්කොළ අයත් උප කාණ්ඩයෙහි

මිල ගණන් 2016 මැයි මාසය තුළ දී පහළ ගියේය. කෙසේ වුවද, ප්‍රවාහන සහ අධ්‍යාපන උප කාණ්ඩ මාසය තුළ දී නොවෙනස්ව පැවතුණි.

මේ අතර ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි.ද. මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත, 2016 අප්‍රේල් මස පැවති සියයට 5.6 සිට 2016 මැයි මස වන විට සියයට 7.0 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය ජා.පා.මි.ද. මූලික උද්ධමනය 2016 අප්‍රේල් මස වාර්තා වූ සියයට 4.3 හි සිට 2016 මැයි මස වන විට සියයට 4.6 දක්වා ඉහළ ගියේය.



ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම
පදනම : 2013 = 100

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| **2014** | ජනවාරි | 103.1 | | | |
| | පෙබරවාරි | 103.0 | -0.1 | | |
| | මාර්තු | 103.2 | 0.2 | | |
| | අප්‍රේල් | 104.1 | 0.9 | | |
| | මැයි | 104.9 | 0.8 | | |
| | ජූනි | 106.2 | 1.2 | | |
| | ජූලි | 107.0 | 0.8 | | |
| | අගෝස්තු | 106.4 | -0.6 | | |
| | සැප්තැම්බර් | 106.4 | 0.0 | | |
| | ඔක්තෝබර් | 106.0 | -0.4 | | |
| | නොවැම්බර් | 106.9 | 0.8 | | |
| | දෙසැම්බර් | 108.6 | 1.6 | | |
| **2015** | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජූනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 | 2.6 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 | 2.7 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව